# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment


මගේ අංකය / எனது இல / My No: DSD/HO/04/09/EMP / 2026/Ac .Pl

ඔබේ අංකය / உமது இல / Your No: ..........................................

දිනය / திகதி / Date: 2026.01.21

සමෘද්ධි චක්‍ර ලේඛ අංක :- 2026/05

සියළුම දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
සියළුම ප්‍රාදේශිය ලේකම්වරුන්,
සියළුම සමෘද්ධි නියෝජ්‍ය හා සහකාර අධ්‍යක්ෂවරුන්

<u>ප්‍රජා සවිබල ගැන්වීමේ ජාතික වැඩසටහන 2026</u>
<u>ජීවනෝපාය සංවර්ධන වැඩසටහන</u>

හැදින්වීම:- 2026 වර්ෂයේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක ප්‍රජා සවිබලගැන්වීමේ ජාතික වැඩසටහනේ මුලික කටයුතු සංවිධානය කිරීමට අදාලව උපදෙස් හා මහපෙන්වීම් අධ්‍යක්ෂ ජනරාල්ගේ අත්සනින් නිකුත් කළ 2026.01.09 දිනැති සමෘද්ධි චක්‍රලේඛ අංක 2026/01 මගින් ලබාදී ඇත. එකී චක්‍රලේඛය අනුව ඔබ දිස්ත්‍රික්කයට ලබා දී ඇති ඉලක්කය හදුනා ගැනීමෙන් පසු ඔවුන්ගෙන් ජීවනෝපාය සංවර්ධනය යටතේ සවිබලගැන්වීමට සුදුසු පවුල් සඳහා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත යෝජිත ජීවනෝපාය සංවර්ධන වැඩසටහන පිළිබඳව මහපෙන්වීම ජීවනෝපාය සංවර්ධන අංශයේ වගකීමක් වන අතර ඒ සඳහා මෙම චක්‍රලේඛය නිකුත් කෙරේ. මෙම චක්‍ර ලේඛයේ ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් වලට අදාලව ක්‍රියාත්මක කරනු ලබන අන්ත දූප්පත් කාණ්ඩයට අදාල වැඩසටහන් විස්තරය පමණක් ඇතුලත්ව ඇත.

2026 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ජීවනෝපාය වැඩසටහන්

I. අන්ත දූප්පත් කාණ්ඩය යටතේ හඳුනා ගන්නා සහභාගිවන්නන් (ප්‍රතිලාභීන් ) සිමිත පිරිසක් සඳහා ජීවනෝපාය ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා මුල්‍ය ප්‍රදානයක් ලබාදීම.

II. දූප්පත් කාණ්ඩය යටතේ හඳුනා ගන්නා සහභාගිවන්නන්ට (ප්‍රතිලාභීන්ට ) සමෘද්ධි බැංකුව මගින් සහන පොලි අනුපාතය මත ව්‍යාපෘති ණය ලබාදීම.

III. අවධානමට ලක් වූ පවුල් කාණ්ඩය යටතේ හඳුනා ගන්නා සහභාගිවන්නන්ට සමෘද්ධි බැංකුව මගින් සහන පොලි අනුපාතය මත ණය ලබාදීම.

2026 වර්ෂයේ ලැබී ඇති භාණ්ඩාගාර ප්‍රතිපාදන ප්‍රමාණය මත ඔබ දිස්ත්‍රික්කයේ අන්ත දූප්පත් කාණ්ඩය යටතේ හඳුනාගනු ලබන සීමිත පවුල් ප්‍රමාණයකට මුල්‍ය ප්‍රදානයක් ලබාදීමට අපේක්ෂා කෙරේ. ඒ අනුව ඔබ දිස්ත්‍රික්කයට මුල්‍ය ප්‍රදානය ලබාදීමට අපේක්ෂිත පවුල් සංඛ්‍යාව හා වෙන්වෙන මුදල් ප්‍රමාණය ඇමුණුම 01 මගින් දක්වා ඇත. එම ඉලක්කය ඉක්මවා යම්කිසි පිරිසක් අන්ත දූප්පත් කාණ්ඩය යටතේ ව්‍යාපෘති ආරම්භ කිරීමට අපේක්ෂා කරන්නේ නම් ඔවුන්ට ද සහන පොලී මත බැංක ණය ලබාදීමට යොමු කළ හැකිය.


1වන අදියර,4 වන මහල , සෙත්සිරිපාය , බත්තරමුල්ල. / 1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல / 1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මුල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director (Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2869824 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 288 |

තවද 2025 වර්ෂයේ ප්‍රජා සවිබලගැන්වීමේ ජාතික වැඩසටහන යටතේ ඔබ දිස්ත්‍රික්කයට ලබාදුන් ඉලක්කයෙන් අන්ත දුප්පත් කාණ්ඩය යටතේ පවුල් සංවර්ධන සැලස්ම සකස් කළ එහෙත් ව්‍යාපෘති සඳහා මූල්‍ය ප්‍රදානයක් ලබා නොදුන් ප්‍රතිලාභීන් ඇත්නම් ඔවුන් මෙම වැඩසටහන යටතේ ඇතුලත් කළ හැකිය

01. අරමුණු

I. අන්ත දුප්පත් පවුල් වල මාසික ආදායම රුපියල් 40000 දක්වා ඉහල නැංවීම තුළින් දුප්පත් කමින් මුදවා ගැනීම

II. එම පවුල් ඒකක වල මාසික ඉතුරුම් ප්‍රවර්ධනය කිරීම

III. අධ්‍යාපන, සෞඛ්‍ය හා පෝෂණය සඳහා ඇති ප්‍රවේශය පහසු කරවීම

IV. ග්‍රාමීය වශයෙන් ව්‍යාප්තව ඇති සම්පත් නිෂ්පාදන ක්‍රියාවලියට ඇතුලත් කර වෙළඳපල වටිනාකමක් ලබාදීම

V. මූලික අවශ්‍යතා සපුරා ගැනීමට එක් එක් පවුල් ඒකකයට ඇති ශක්‍යතාවය වර්ධනය කිරීම

02. මූල්‍ය ප්‍රදානය ලබාදීම සඳහා සුදුසු ප්‍රතිලාභීන් හඳුනා ගැනීමේ නිර්නායක

I. 2026 වර්ෂයේ සවිබලගැන්වීමේ වැඩසටහන සඳහා හඳුනාගත් අන්ත දුප්පත් කාණ්ඩයට අයත් පවුල් ඒකකයක සාමාජිකයෙක් විය යුතුය.

II. 2024/2025 වර්ෂවල ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන නොලැබූ පවුල් ඒකකයක් විය යුතුය

III. 2024/ 2025 වර්ෂවල අලෙවි අංශය මගින් තරුණ රැකියා ගැන්වීමේ වැඩසටහන යටතේ හෝ බොජුන්හල් සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන නොලැබූ පවුල් ඒකකයක් විය යුතුය.

IV. වෙනත් රාජ්‍ය ආයතනයකින් 2024/2025 වර්ෂයේ ජීවනෝපාය ව්‍යාපෘති සඳහා මූල්‍ය ප්‍රදානයක් නොලැබූ පවුල් ඒකක විය යුතුය.

V. ඔබ දිස්ත්‍රික්කයට හිමි ව්‍යාපෘති සංඛ්‍යාව සීමිත බැවින් අන්ත දුප්පත් කාණ්ඩය යටතේ ජීවනෝපාය ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට අපේක්ෂිත පවුල් පමණක් තෝරා ගැනීම වැදගත් වේ.

VI. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක ජීවනෝපාය හෝ රැකියා අවස්ථා යන දෙකෙන්ම මූල්‍ය ප්‍රදානය ලබාදිය හැක්කේ එක් අවස්ථාවක් පමණි.

**වැදගත්:- දුප්පත් හා අවදානමට ලක් වූ කාණ්ඩ දෙක සඳහා සහන පොලී මත ව්‍යාපෘති ණය ලබාදීමේ ක්‍රමවේදයට අදාල උපදෙස් ඉතා කඩිනමින් ක්ෂුද්‍ර මූල්‍ය අංශය මගින් ලබාදීමට කටයුතු කරනු ඇත.**

03. සුදුසු ව්‍යාපෘති හඳුනා ගැනීම

ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ මූලික ඉලක්කය වන්නේ හඳුනාගනු ලබන පවුල් ඒකක වල මාසික ආදායම වර්ධනය කිරීම මගින් ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීමයි. 2025 වර්ෂයේ හඳුනාගත් සමහර ව්‍යාපෘති දෙස අවධානය යොමු කර බලන විට අපේක්ෂිත ආදායම ලබා ගැනීම දුෂ්කර බව නිරීක්ෂණය වේ. එබැවින් ව්‍යාපෘති හඳුනා ගැනීමේ දී පහත කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් වේ. ඔබ දිස්ත්‍රික්කයට අදාල ව්‍යාපෘති හඳුනාගැනීමේ දී වෙළඳපොළ සමීක්ෂණය මගින් හඳුනාගත් ව්‍යාපෘති කෙරෙහි

අවධානය යොමු කිරීම වැදගත් වේ. එමෙන්ම කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා සත්ත්ව නිෂ්පාදන සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ආදි රාජ්‍ය හා පෞද්ගලික ආයතන සමඟ ද සාකච්ඡා කිරීම ඵලදායි ව්‍යාපෘති හඳුනා ගැනීමට රුකුලක් වේ.

I. දේශීය හෝ විදේශීය වෙළඳපල ඉලක්ක වූ නිෂ්පාදනයක් ( විසිතුරු මත්ස්‍ය වගාව, විසිතුරු මල් වගාව ආදි)

II. අගය එකතු කළ නිෂ්පාදන ( ටින් කළ ආහාර, දේශීය ඖෂධ වර්ග ආදි )

III. නව තාක්ෂණය හා බද්ධ වූ නිෂ්පාදනයක් ( කුඩා පරිමාණ ගෘහස්ථිත වගාව ආදි)

04. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ පියවර

I. 2026/01 චක්‍රලේඛය අනුව එක් එක් පවුල් ඒකකය සඳහා සුදුසු ජීවනෝපාය ව්‍යාපෘති හඳුනා ගැනීමෙන් පසු එක් එක් පවුල් ඒකකය සඳහා ව්‍යාපාර සැලස්ම සකස් කිරීම කළ යුතුය. ඒ සඳහා 2025 වර්ෂයේ භාවිතා කල ව්‍යාපාර සැලසුම් ආකෘතියම භාවිතා කළ යුතුය. මෙම ව්‍යාපාර සැලස්ම සකස් කිරීමේ දී ව්‍යාපෘති අනුව අදාල සහය ආයතන සමඟ සාකච්ඡා කිරීමෙන් නිවැරදි ව්‍යාපාර සැලස්මක් සකස් කිරීමටත්, තාක්ෂණික පුහුණුව ආදි ඉදිරි සහයන් ලබාදීම පහසු වේ. ව්‍යාපාර සැලස්ම පිටපත් දෙකකින් සකස් කර එක් පිටපතක් ප්‍රතිලාභියාටත් අනෙක් පිටපත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගොනු ගත කිරීම කළ යුතුය . එක් ප්‍රතිලාභියෙකුගේ ව්‍යාපාර සැලසුම් පිටපත් දෙක සකස් කිරීමට රුපියල් 30.00 මුදලක් ලබා දේ.

II. ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර ව්‍යාපෘති වර්ගය මත පදනම්ව සහය ආයතන වල දායකත්වයෙන් තාක්ෂණික පුහුණුව ලබාදීම.( තාක්ෂණික පුහුණුව ලබාදීමට අදාල උපදෙස් ඉදිරියේ දී ලබාදීමට කටයුතු කරනු ඇත.)

III. ව්‍යාපෘති වාර්තාව සකස් කර එහි මූලික නිර්දේශ ලබාගැනීමෙන් පසු ප්‍රාදේශීය ලේකම් අනුමැතියෙන් ව්‍යාපෘතිය ආරම්භ කිරීම කළ හැකිය. ව්‍යාපෘති අරමුදල් වැය කිරීමේ දී රජයේ ප්‍රසම්පාදන ක්‍රමවේදය, මුදල් රෙගුලාසි හා මෙම චක්‍රලේඛයේ උපදෙස් අනුගමනය කර ව්‍යාපෘති අවශ්‍යතා ව්‍යාපෘතිලාභීන්ට ලබාදිය යුතුය.

IV. ප්‍රතිලාභියා සමඟ ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර ගිවිසුම් ගත විය යුතු අතර ඒ සඳහා පෙර වර්ෂයේ භාවිතා කළ ගිවිසුම ම භාවිතා කළ යුතුය. (එහි පිටපතක් අමුණා ඇත.)

05. අරමුදල් භාවිතය

I. මෙම වැඩසටහන යටතේ හඳුනාගන්නා එක් අන්ත දුප්පත් ප්‍රතිලාභියෙක් සඳහා රජයේ දායකත්වය ලෙස රුපියල් 150,000.00 උපරිමය දක්වා ලබාදිය හැකිය. නමුත් ලබාදෙන මුදල තීරණය වන්නේ ව්‍යාපාර සැලස්ම අනුවය.

II. ව්‍යාපෘතිය සඳහා මූල්‍ය ප්‍රදානයේ දායකත්වයට සමාන දායකත්වයක් සහභාගිවන්නා දැරිය යුතුය. එය ව්‍යාපෘති වාර්තාව මගින් ඉදිරිපත් කළ යුතුය. එම දායකත්වය ඔහු සතු මුදල් ,භූමිය, නිවස, විදුලිය, ජලය හා ශ්‍රමය ආදි කුමන මාධ්‍යකින් වුව ද පෙන්විය හැකිය.

III. මූල්‍ය ප්‍රදානය භාවිතා කළ හැක්කේ ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා හඳුනාගත් ස්ථාවර වත්කම් ( ප්‍රාග්ධන භාණ්ඩ, සතුන්, රෝපණ ද්‍රව්‍ය ආදි ) මිල දී ගැනීම සඳහා පමණි

IV. ඔබ දිස්ත්‍රික්කයට ලබාදෙන ව්‍යාපෘති සංඛ්‍යාව හා ප්‍රතිපාදන ප්‍රමාණය මත ව්‍යාපාර සැලසුම් සකස් කිරීමෙන් පසු අරමුදල් ශේෂයක් ඉතිරි වන්නේ නම් ඒ සඳහා අන්ත දුප්පත් කාණ්ඩය යටතේම නව ව්‍යාපෘතිලාභින් හඳුනා ගැනීමේ හැකියාව ඇත. එසේ හඳුනා ගන්නා සංඛ්‍යාව ප්‍රධාන කාර්යාලයේ ජීවනෝපාය සංවර්ධන අංශයට ඉදිරිපත් කර අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබාගත යුතුය.

V. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දි ඔබ දිස්ත්‍රික්කයට වෙන්කර ඇති මුළු ව්‍යාපෘති මුදලට 2% පරිපාලන වියදමක් වෙන් වේ. ඉන් 1% ප්‍රාදේශිය ලේකම් කාර්යාලය සඳහාත්, 0.5% දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ කාර්යාලටත් ඉතිරි 0.5% ප්‍රධාන කාර්යාලයේ ජීවනෝපාය සංවර්ධන අංශයේ පරිපාලන වියදම් ලෙස වෙන් වේ. මෙම පරිපාලන වියදම දැරිය හැක්කේ ව්‍යාපෘති අරමුදල් වැය කිරීමට සාපේක්ෂව පමණි.

06. ක්‍රියාකාරි සැලසුම

2026 වර්ෂයේ ජීවනෝපාය සංවර්ධන අංශයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අප අංශය මගින් ඉදිරිපත් කර ඇති ක්‍රියාකාරි සැලසුමේ ඉලක්ක අනුවම ඉටු කිරීමට අපේක්ෂා කෙරේ. එම සැලසුම මත පදනම්ව වසම් මට්ටමින් සුදුසු ව්‍යාපෘතිලාභින් හඳුනා ගැනීමේ සිට ව්‍යාපෘති ආරම්භ කිරීම දක්වා යෝජිත ක්‍රියාකාරකම් ඇමුණුම 02 ඉලක්ක අනුව අවසන් කිරීමට තීරණය කර ඇත. ඒ අනුව සියළු නිළධාරින් දැනුවත් කර ඔබ දිස්ත්‍රික්කයේ ඉලක්කය යෝජිත සැලසුම අනුව අවසන් කිරීමට කාරුණිකවන්න.

07. ප්‍රතිලාභි ඉලක්ක කර ගත් පුහුණුව

දිර්ඝ කාලයක් ජීවනෝපාය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙන් ලද අත්දැකීම් අනුව හුදු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූල්‍ය සහය ලබාදීමෙන් පමණක් එය සාර්ථක නොවේ. විශේෂයෙන්ම ව්‍යාපෘතිය ආරම්භයේ සිට එහි නිෂ්පාදන හෝ සේවාවන් අපේක්ෂිත ආදායම් ඉලක්ක ලබාගන්නා තෙක් අඛණ්ඩව ව්‍යාපෘතිලාභින් වෙත පුහුණුව හා මඟපෙන්වීම් ලබාදීම වැදගත් වේ. 2026 වර්ෂයේ මෙම මූල්‍ය ප්‍රදානයන් ලබාදෙන සියලු ප්‍රතිලාභින්ට පහත විෂයන් යටතේ පුහුණුව ලබාදීමට අපේක්ෂා කෙරේ. ( එම පුහුණු වැඩමුළු පැවැත්වීමට අදාල මඟපෙන්වීම් පසුව ලබාදීමට කටයුතු කරනු ඇත.) එමෙන්ම ඔබ දිස්ත්‍රික්කයේ ජීවනෝපාය සංවර්ධනයට අදාල සහය ආයතනයන් ද 2026 වර්ෂයේ තම ක්‍රියාකාරි සැලසුම් යටතේ විවිධ පුහුණු වැඩසටහන් සංවිධානය කර ඇත්නම් ඒ සඳහා ද මෙම ප්‍රතිලාභින් සම්බන්ධ කළ හැකිය.

I. විෂයානුබද්ධ තාක්ෂණික පුහුණුව ( Subject wise Technical Training )
II. ව්‍යාපාර කුසලතා පුහුණුව ( Business Skills Training )
III. මූල්‍ය සාක්ෂරතා පුහුණුව ( Financial Literacy Training )

08. ප්‍රගතිය වාර්තා කිරීම

2026 වර්ෂයේ ක්‍රියාත්මක ජීවනෝපාය සංවර්ධන වැඩසටහනේ අපේක්ෂිත ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට නම් වසම් මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා අඛණ්ඩ පසුවිපරම් ක්‍රියාවලියක් සිදුකිරීම අත්‍යවශ්‍ය බව අවධාරණය කරනු කැමැත්තෙමි. ඒ සඳහා ජාතික මට්ටමින් වැඩසටහන් හා ත්‍රෛයි

මාසිකව ප්‍රගති සමාලෝචන වැඩමුළු පැවැත්වීමට අපේක්ෂා කෙරේ. එමෙන්ම දිස්ත්‍රික් මට්ටමින්, ප්‍රාදේශිය ලේකම් කාර්යාල මට්ටමින් හා බැංකු කලාප මට්ටමින් පැවැත්වෙන ප්‍රගති සමාලෝචන වැඩසටහන් වල ප්‍රමුඛත්වයක් දී ප්‍රගතිය සාකච්ඡා කිරීමට අවශ්‍ය කටයුතු සංවිධානය කරන්න. මේ සමඟ ඔබ වෙත යොමු කරන ඇමුණුම 03 ආකෘතිය අනුව ජීවනෝපාය සංවර්ධන අංශයේ ප්‍රගතිය සෑම මසකම 10 දිනට පෙර ජීවනෝපාය සංවර්ධන අංශයේ jeevonopaya@gmail.com විද්‍යුත් ලිපිනය වෙත යොමු කිරීමට කටයුතු කරන්න.

ඇමුණුම 03 ආකෘතිය අනුව ප්‍රගතිය වාර්තා කිරීම සඳහා මෙම ආකෘතිය අනුව ප්‍රාදේශිය ලේකම් කාර්යාල මට්ටමින් ලබාගැනීම සඳහා සුදුසු ආකෘතිය සකස් කර ලබාදීමට කටයුතු කරන්න.

එමෙන්ම මෙම වැඩසටහන සඳහා තෝරාගනු ලබන සහභාගිවන්නන්ගේ තොරතුරු ( ව්‍යාපෘතියේ ආරම්භයේ සිට ) ප්‍රජා සවිබලගැන්වීමේ කාර්යයන් කළමනාකරණය සඳහා සකස් කර ඇති Empower IS (EIS) තොරතුරු කළමනාකරණ පද්ධතියට ඇතුලත් කිරීම අනිවාර්ය වේ.

2026 වර්ෂයේ ජීවනෝපාය සංවර්ධන අංශය මගින් ක්‍රියාත්මක කිරීමට යෝජිත ඉහත වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා ඔබ ඇතුළු සියළු කාර්යය මණ්ඩලය දක්වන සහය ඉතා අගය කොට සලකන අතර මේ පිළිබඳව වැඩිදුර විස්තර අධ්‍යක්ෂ (ජීවනෝපාය සංවර්ධන) දුරකථන අංක 0712386143 හෝ සමෘද්ධි කළමනාකරු 0714408926 මගින් හෝ jeevonopaya@gmail.com යන විද්‍යුත් ලිපිනය වෙතින් ලබාගන්නා ලෙස කාරුණිකව දන්වමි.

සී.ඩී.කළුආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:-

1. ලේකම්, ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය - කා.දැ.පි
2. අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ( සංවර්ධන ) සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස
3. අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ( සැලසුම් ) සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස
4. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස
5. ප්‍රධාන මූල්‍ය නිළධාරි, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස
6. ප්‍රධාන ගණකාධිකාරි,සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස
7. සියළු අංශ ප්‍රධානින් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස

# ව්‍යාපාරික යෝජනාව

(........................................................................................................................................)

## 1.1 විධායක සාරාංශය

1.1.1. ආයෝජනය කර ඇති මුලු ප්‍රාග්ධනය - වන ආයෝජනයෙන් පසු (4.2) ..............................

1.1.2. මාසයක් සඳහා මුලු මෙහෙයුම් වියදම (4.1) ..............................

1.1.3. ලාභදායිත්වය පිළිබඳව ව්‍යාපාරයේ ස්ථාවරත්වය (වාර්ෂික) ..............................

a. දල ලාභ අනුපාතය (දල ලාභය/විකුණුම්)*100 ..............................

b. ශුද්ධ ලාභ අනුපාතය (ශුද්ද ලාභය/විකුණුම්)*100 ..............................

c. හිමිකම මත ප්‍රතිලාභ අනුපාතය (ශුද්ධ ලාභය/යෙදවූ ප්‍රාග්ධනය)*100 ..............................

**(හිමිකම = යෙදවූ ප්‍රාග්ධනයට (2.8 හි n) + 2.9 හි මුළු එකතුව (4A), ණය මුදල් හැර (2A))**

## 1.2. ව්‍යවසායකයාගේ මූලික තොරතුරු

1.2.1. ව්‍යාවසායකයාගේ සම්පූර්ණ නම : ..............................

..............................

1.2.2. ස්ථිර ලිපිනය : ..............................

..............................

1.2.3. දිස්ත්‍රික්කය: .............................. ප්‍රා. ලේ. කොට්ටාශ ..............................

1.2.4. ග්‍රාම නිලධාරී කොට්ටාසය : ..............................

1.2.5. ජා.හැ. අංකය : .............................. 1.2.6. අස්වැසුම ගෘහ අංකය ..............................

1.2.7. දුරකථන අංකය: .............................. 1.2.8. සමෘද්ධි බැංකු ගි. අංකය ..............................

## 2. ව්‍යාපාරයේ මූලික තොරතුරු

**2.1. ව්‍යාපාරය ක්‍රියාත්මක වන අංශය**

| | | | | | |
|---|---|---|---|---|---|
| **a.** **කෘෂි** | ☐ | **c.** ධීවර | ☐ | **e.** සේවා | ☐ |
| **b.** **පශු සම්පත්** | ☐ | **d.** නිෂ්පාදන | ☐ | **f.** වෙනත් | ☐ |

**2.2** ව්‍යාපාරයේ නම (දැනටමත් ව්‍යාපාරයක් ඇත්නම්) : ..............................

2.2.1. ව්‍යාපාරය ලියාපදිංචි කර ඇත්නම් **a.** අංකය: .............................. **b.** දිනය: ..............................

2.2.2. එසේ නොවේ නම් ලියාපදිංචිය කරන දිනය: ..............................

**2.3.** තෝරාගත් ව්‍යාපාරය පිළිබඳව SWOT (ශදුඅත) විශ්ලේෂණය

| **ශක්තීන්** (ඔබේ ව්‍යාපාරය තුල ඔබේ තරඟකරුවන්ට වැඩ ඔබ සතු ගුණාංග හෝ සම්පත් මොනවාද?) | **දුර්වලතා** (මෙම ව්‍යාපාරය සාර්ථකකව කරගෙන යාමට වැඩිදියුණු කල යුත්තේ කුමක්ද? (උදා: පුහුණුව, කුසලතාව, සම්පත්) |
|---|---|
| .............................. | .............................. |
| .............................. | .............................. |
| .............................. | .............................. |
| .............................. | .............................. |
| .............................. | .............................. |
| .............................. | .............................. |
| .............................. | .............................. |
| **අවස්ථා** (ඔබට ප්‍රයෝජනයට ගත හැකි ප්‍රවණතා හෝ අවස්ථා මොනවාද?) | **තර්ජන** (ඔබේ ව්‍යාපාරයට ඇති තර්ජන මොනවාද? (උදා: ස්වභාවික විපත්, තරඟකාරීබව, එමගින් ඉල්ලුම අඩුවීම්, යටිතල පහසුකම් නොමැතිවීම, විදුලිය, ජලය, පවුලේ ගැටළු, සොර සතුරු උවදුරු, රැකවරනය, වගකීම්) |
| .............................. | .............................. |
| .............................. | .............................. |
| .............................. | .............................. |
| .............................. | .............................. |
| .............................. | .............................. |

**2.4.** මෙම ව්‍යාපාරය තෝරාගැනීමේ අරමුණු. (*ව්‍යාපාරය ආරම්භ කිරීමේ අපේක්ෂාවන්*)

1 ..............................................................................................................
2 ..............................................................................................................
3 ..............................................................................................................
4 ..............................................................................................................
5 ..............................................................................................................

**2.5.** **ඔබේ ව්‍යාපාරය මගින් සැපයීමට අපේක්ෂිත භාණ්ඩ හා සේවා තොරතුරු**

| භාණ්ඩ හෝ සේවා වර්ගය | භාණ්ඩය හෝ සේවාව පිළිබඳ කෙටි විස්තරයක් |
|---|---|
| | |
| | |

**2.6.** මෙම ව්‍යාපාරයේ කටයුතු කරන්නේ කවුද සහ ඔවුන් කරන්නේ කුමක්ද

*(සටහන: අවම වශයෙන් එක සාමාජිකයෙක් හෝ පූර්ණකාලීනව මෙම ව්‍යාපාරයේ කටයුතු සිදු කල යුතුයි)*

| අංක | කටයුතු කරන්නේ කවුද | ව්‍යාපාරික කටයුත්තේ ස්වාභාවය | මාසික වැටුප / වේතන (රු.) |
|---|---|---|---|
| 1 | | | |
| 2 | | | |
| 3 | | | |

**2.7.** **දැනටමත් ඔබ සතු භෞතිත හා මූල්‍ය සම්පත්:**

(උදා: ඉඩම්, ගොඩනැගිලි, යන්ත්‍රසූත්‍ර හා මෙවලම්, අමුද්‍රව්‍ය, වෙළඳ තොගය, ලැබීමට හා ගෙවීමට ඇති දෑවලින් ව්‍යාපාරයට යොදවන කොටස්)

| අංක | සම්පත්වල ස්වරූපය | සියලු වත්කම් (රු) | සියලු වගකීම් (රු) |
|---|---|---|---|
| a | | | |
| b | | | |
| c | | | |
| d | | | |
| e | | | |
| f | | | |
| g | | | |
| h | | | |
| i | | | |
| j | | | |
| | **වගකීම් (ගෙවිය යුතු දෑ)** | | |
| k | **ගෙවිය යුතු බැංකු ණය** | | |
| l | | | |
| m | | | |
| n | **අයිතිකරු යෙදවූ ප්‍රාග්ධනය** | | |
| | | | |

**2.8.** **මිලදී ගැනීමට යෝජිත සම්පත්**

| අංක | **a.** මිලදී ගැනීමට අපේක්ෂිත දේ | **b.** සවිබල ගැන්වීමේ ප්‍රධානය යොදවන මුදල (රු) | **c.** තමන් යොදවන මුදල (රු) | **d.** ලබාගන්නා ණය මුදල (රු) |
|---|---|---|---|---|
| 1 | | | | |
| 2 | | | | |
| 3 | | | | |

| | | | | |
|---|---|---|---|---|
| 4 | එකතුව | | | |

3 අළෙවි සැලසුම

3.1 ඔබේ ගැනුම්කරුවන් හා විකුණුම් පිළිබඳ තොරතුරු - (මාසික)

ඔබේ ගැනුම්කරුවන් පිලිබඳ කෙටි විස්තරයක් ..............................................................................

| අංක | භාණ්ඩය/සේවාවේ නම | විකුණුම් ප්‍රමාණය | ඒකක මිල රු. | විකුණුම් ආදායම (රු) |
|---|---|---|---|---|
| 1 | | | | |
| 2 | | | | |
| 3 | එකතුව රු. | | | |

3.2 ඔබ ඔබේ භාණ්ඩය හෝ සේවාව ඔබේ තරඟකරුවන්ට වඩා ආකර්ශනීය ලෙස ඉදිරිපත් කරන්නේ කෙසේද?:

| නිෂ්පාදිත භාණ්ඩය හෝ සේවාව | මිල නියම කිරීම සම්බන්ධව | බෙදාහැරීමේ ක්‍රමය සම්බන්ධව | ප්‍රවර්ධනය සම්බන්ධව |
|---|---|---|---|
| | | | |

4 මූල්‍ය සැලැස්ම හා මූල්‍යකරණය

සැලකිය යුතුයි: ව්‍යාපාරය මාසයක් පවත්වාගෙන යෑම සඳහා දැරිය යුතු සියලු වියදම් අදාල කොටසේ සටහන් කරන්න. නිෂ්පාදිත හෝ සේවා ඒකකට මෙම පිරිවැය ගණනය කිරීම් එකක් බැගින් සම්පූර්ණ කළ යුතු වේ)

4.1 මුළු මාසික පිරිවැය

| අංක | වියදම් විස්තරය | ඒකක ගණන | මිල රු. | වටිනාකම රු. |
|---|---|---|---|---|
| VC | <u>විචල්‍ය පිරිවැය වර්ග</u> | | | |
| 1 | | | | |
| 2 | | | | |
| 3 | | | | |
| 4 | | | | |
| 5 | | | | |
| 6 | | | | |
| 7 | | | | |
| 8 | | | | |
| 9 | | | | |
| VC | මුලු විචල්‍ය පිරිවැය එකතුව | | | |
| FC | <u>ස්ථාවර පිරිවැය වර්ග</u> | | | |
| 1 | | | | |
| 2 | | | | |
| 3 | | | | |
| 4 | | | | |
| 5 | | | | |
| 6 | | | | |
| 7 | | | | |
| 8 | | | | |
| FC | **මුලු ස්ථාවර පිරිවැය එකතුව** | | | |

<u>**පිරිවැය විශ්ලේෂණය**</u>

| | | | | |
|---|---|---|---|---|
| VC | මුලු විචල්‍ය පිරිවැය | | | - |
| FC | මුලු ස්ථාවර පිරිවැය | | | - |
| TC | **මුලු මාසික පිරිවැය (මෙහෙයුම්)** | | | |
| USP | **ඒකකයක විකුණුම් මිල** | | | |
| UVC | **<u>අඩු:</u> ඒකකයක විචල්‍ය පිරිවැය** | | | |
| CON | **ඒකකයක දායකත්වය** | | | |

| | | |
|---|---|---|
| UOFBE | ලාභ/පාඩු නොලබන තත්වයේ දී නිපදවිය යුතු හෝ අලෙවිකළ යුතු ඒකක ප්‍රමාණය | |

**4.2** අරමුදල් ප්‍රභවය

| අංක | මූලාශ්‍රය (උදා: ඉතුරුම්, ප්‍රදාන වැඩසටහන් ආධාර, ණය ආදිය) | වටිනාකම (රු) |
|---|---|---|
| 1 | 2.දැනටමත් ව්‍යාපාරයට මුදල් යොදවා ඇති ආකාරය (2.7 හි එකතුව) | |
| | 1. ව්‍යාවසායකයාගේ මුදල් වශයෙන් යොදවා ඇති (2.7 හි අයිතිකරු ප්‍රාග්ධනය) | |
| | 2. ව්‍යවසායකයා ණය ලෙස ලබාගෙන යොදවා ඇති (2.7 හි ණය) | |
| 2 | සවිබල ගැන්වීමේ වැඩසටහනෙන් ලැබෙන ප්‍රධානයන් (2.8 හි b) | |
| 3 | ව්‍යවසායකයා පෞද්ගලිකව යෙදවීමට අපේක්ෂිත මුදල (2.8 හි c) | |
| 4 | තවදුරටත් ලබා ගැනීමට අපේක්ෂිත ණය මුදල් (2.8 හි d) | |
| 5 | ව්‍යාපෘතියේ මුලු ආයෝජනය | |

**4.3** ලාභාලාභ පුරෝකථනය

| විස්තරය | මාසික | පළමු වර්ෂය | දෙවන වර්ෂය |
|---|---|---|---|
| අපේක්ෂිත විකුණුම් (3.1) | | | |
| <u>අඩුකළා:</u> | | | |
| අපේක්ෂිත වියදම (විචල්‍ය වියදම) (41) | - | | |
| අපේක්ෂිත දල ලාභය/අලාභය (දායකත්වය | - | | |
| <u>අඩුකළා:</u> | | | |
| මුලු ස්ථාවර වියදම් (4.1) | | | |
| අපේක්ෂිත ශුද්ධ ලාභය/අලාභය | | | |

**4.4.** මෙම ව්‍යාපාර යෝජනාවේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් මා වෙත නියමිත

.................................

.................................................................... ....................................... ..

**ඉල්ලුම් කරුගේ නම** අත්සන දිනය

**5** අනුමැතිය

| අංක | නම | තනතුර | කාර්යය | අස්සන | දුරකථන අංකය |
|---|---|---|---|---|---|
| 1 | | සමෘද්ධි සංවර්ධන නිලධාරී | ඉදිරිපත් කර ඇති තොරතුරු සත්‍ය බව. | | |
| 2 | | පුහුණු කළමණාකරු | ව්‍යාපාර සැලැස්ම සැකසීම | | |
| 3 | | කළාප කළමණාකරු | නිර්දේශ කර ඉදිරිපත් කිරීම | | |
| 4 | | ව්‍යාපෘති කළමණාකරු | නිර්දේශ කර තාක්ෂණ නිලධාරීට ඉදිරිපත් කිරීම | | |
| 5 | | තාක්ෂණික නිලධාරී | තාක්ෂණික අනුමැතිය ලාබාදීම | | |
| 6 | | බැංකු සමිති කළමණාකරු | නිර්දේශ කර ඉදිරිපත් කිරීම | | |
| 7 | | ප්‍රාදේශීය ලේකම් | අනුමත කිරීම (නිල මුද්‍රාව) | | |

ඇමුණුම 06

| කාර්යාල ප්‍රයෝජනය සඳහා | |
|---|---|
| ගිවිසුම් පත් අංක | |

**ප්‍රජා සවිබල ගැන්වීමේ වැඩසටහන යටතේ අස්වැසුම්ලාභීන් සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව හා ව්‍යාපෘතිලාභියා අතර එළඹෙනු ලබන ගිවිසුම**

මෙහි පළමු පාර්ශවය යයි කියනු ලබන ශ්‍රීලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ 2017 අංක 2 දරන පනතින් සංශෝධිත 2013 අංක 01 දරණ දිවි නැගුම පනත මගින් ස්ථාපිත කරණ ලද 4 වන මහල, සෙත්සිරිපාය , බත්තරමුල්ල යන ස්ථානයෙහි පිහිටි සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙනුවෙන් ...................... දිස්ත්‍රික්කයෙහි .................. ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශිය ලේකම් හෝ ඔහු විසින් බලය පවරනු ලබන සමෘද්ධි කළමනාකරු එක් පාර්ශවයකට ද,

දෙවන පාර්ශවයයි කියනු ලබන එම බල ප්‍රෙද්ශයේ .............................................. ( ස්ථිර ලිපිනය ) හි පදිංචි ජා.හැ.ප. අංක ...................................... දරණ ( සම්පූර්ණ නම )මයා / මිය /මෙනවිය යන අය හා ( මින් මතු ව්‍යාපෘතිලාභියෙකු වශයෙන් හඳුන්වනු ලබන ) අනෙක් පාර්ශවයටද බැදි දෙපාර්ශවයේ එකගත්වය ඇතිව වර්ෂ 20................. ක් වූ ..................... මස ............ වෙනි දින ඇති කර ගන්නා ලද ගිවිසුමයි.

එකී ගිවිසුමෙහි කොන්දේසි කවරේද යත්,

1. ඉහත ගිවිසුම් ප්‍රකාරව ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ ආදායම් උත්පාදන කටයුතු ප්‍රවර්ධනය කිරිම පිණිස හඳුනා ගන්නා ලද ( ව්‍යාපෘතියේ නම )................................. සඳහා එකී ව්‍යාපෘතිලාභියා සුදුසු වන හෙයින් පහත දක්වා ඇති ව්‍යාපෘති යෙදවුම් මතු දැක්වෙන කොන්දේසි වලට යටත්ව භාරදීමට දෙපාර්ශවය එකගවේ.

2. ඉහත ගිවිසුම් ප්‍රකිරව සමෘද්ධි වැඩසටහන යටතේ උක්ත ව්‍යාපෘති ආරම්භ කිරිම වෙනුවෙන් පහත ලේඛනයේ සඳහන් රුපියල් ............................. ක් ( රු................. ) වටිනා ව්‍යාපෘති / යෙදවුම් අද දින ව්‍යාපෘති ලාභියා වෙත භාරදුන් බවට දෙපාර්ශවයම එකග වේ.

3. ඉහත ගිවිසුම් ප්‍රකාරව ලබා දෙන ලද වගා ව්‍යාපෘතිය / ............................ව්‍යාපෘතිය අඛණ්ඩ ගෙන යන බවට දෙපාර්ශවය එකගවේ.

4. ඉහත ගිවිසුම් ප්‍රකාරව ලබා ගත් එකී යෙදවුම් මෙම ව්‍යාපාතිය සඳහා පමණක් නිසි ලෙස යොදා ගනිමින් ව්‍යාපෘතිය සාර්ථකව පවත්වා ගෙන යාමට දෙවන පාර්ශවය බැදි සිටී.

5. ඉහත ගිවිසුම් ප්‍රකාරව ව්‍යාපාති ක්‍රියාත්මක කිරිමේදි ස්වභාවික හානියක් හැර, නොසැලකිලිමත් කම නිසා ව්‍යාපෘතිට හානියක් සිදු විමෙන් ව්‍යාපෘතිය අසාර්ථක වුවහොත් රජය විසින් දරණ ලද මුළු මුදල දෙවන පාර්ශවය විසින් පළමු පාර්ශවයට ගෙවිමට බැදි සිටී.

6. ඉහත ගිවිසුම් ප්‍රකාරව ආරම්භ කරන ලද ව්‍යාපෘතිය යම් හේතුවක් නිසා හානියට පත් වුවහොත් වහාම ඒ බව වහාවම ඒ බව වසමේ සමෘද්ධි සංවර්ධන නිලධාරි හෝ ( ව්‍යාපෘති / මුලස්ථාන ) කළමනාකරු වෙත සිද්ධිය සිදුවි පැය 24 ක් ඇතුලත කරන බවට දෙවන පාර්ශවය එකගවේ.

7. ඉහත ගිවිසුම් ප්‍රකාරව ව්‍යාපෘතිය අධීක්ෂණය හා පසු විපරම් කිරීම සමෘද්ධි සංවර්ධන නිලධාරියාට / ව්‍යාපෘති කළමනාකරුට හා අදාල අනෙකුත් සහාය සේවා සපයන නිලධාරීන්ටත් ඇති බව දෙපාර්ශවය පිළිගනී.

8. මෙම ගිවිසුම අනුව ව්‍යාපෘතිය සම්බන්ධ ඉහත කොන්දේසි උල්ලංඝනය කිරීමෙන් හෝ කඩකිරීමෙන් මෙම දෙපාර්ශවය අතර ඇතිවන ආරවුල් හෝ ගැටළු සහගත තත්වයකදී අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තීරණය අවසාන තීරණය බව දෙපාර්ශවය පිළිගනී.

මීට සාක්ෂි වශයෙන් පළමු පාර්ශවය සඳහා සමෘද්ධි දෙපාර්තමේන්තුව වෙනුවෙන් ........... ප්‍රාදේශීය ලේකම් හෝ බලය පවරන ලබන සමෘද්ධි කළමනාකරු සහ දෙවන පාර්ශවය වෙනුවෙන් ව්‍යාපෘතිලාභියා වර්ෂ......... ක් වූ .... මස .... වනි දින .......................... හිදී අත්සන් තබන ලදී.

| | |
|---|---|
| පළමු පාර්ශවය | දෙවන පාර්ශවය |
| අත්සන ........................... | අත්සන ................... |
| මුලස්ථාන / ව්‍යාපෘති කළමනාකරු | ව්‍යාපෘතිලාභියා |
| (නිල මුද්‍රාව ) | ජා. හැ. ප. අංකය. .......................... |
| දිනය : | දිනය : |

| | |
|---|---|
| පළමු පාර්ශවය වෙනුවෙන් අත්සනට සාක්ෂි | පළමු පාර්ශවය වෙනුවෙන් අත්සනට සාක්ෂි |
| 1. අත්සන : | 2. අත්සන : |
| නම: | නම : |
| ජා. හැ. ප. අංකය : | ජා. හැ .ප. අංකය: |

Anex 01

# ප්‍රජා සවිබලගැන්වීමේ ජාතික වැඩසටහන 2026

## ජීවනෝපාය සංවර්ධන වැඩසටහන

දිස්ත්‍රික් මට්ටමින් අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව ප්‍රතිපාදන වෙන් කිරීම

| අංකය | දිස්ත්‍රික්කය | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව | ව්‍යාපෘති සඳහා වෙන්වන මුදල රු:- | දි. ලේ පරිපාලන වියදම .5% | ප්‍රා.ලේ පරිපාලන වියදම 1% | දිස්ත්‍රික්කයට වෙන්වන මුළු මුදල රු:- |
|---|---|---|---|---|---|---|
| | කොළඹ | 275 | 41,250,000.00 | 206,250.00 | 412,500.00 | 41,868,750.00 |
| | ගම්පහ | 515 | 77,250,000.00 | 386,250.00 | 772,500.00 | 78,408,750.00 |
| | කළුතර | 680 | 102,000,000.00 | 510,000.00 | 1,020,000.00 | 103,530,000.00 |
| | ගාල්ල | 776 | 116,400,000.00 | 582,000.00 | 1,164,000.00 | 118,146,000.00 |
| | මාතර | 525 | 78,750,000.00 | 393,750.00 | 787,500.00 | 79,931,250.00 |
| | හම්බන්තොට | 350 | 52,500,000.00 | 262,500.00 | 525,000.00 | 53,287,500.00 |
| | කුරුණෑගල | 1070 | 160,500,000.00 | 802,500.00 | 1,605,000.00 | 162,907,500.00 |
| | පුත්තලම | 350 | 52,500,000.00 | 262,500.00 | 525,000.00 | 53,287,500.00 |
| | මහනුවර | 1100 | 165,000,000.00 | 825,000.00 | 1,650,000.00 | 167,475,000.00 |
| | මාතලේ | 550 | 82,500,000.00 | 412,500.00 | 825,000.00 | 83,737,500.00 |
| | නුවරඑළිය | 1400 | 210,000,000.00 | 1,050,000.00 | 2,100,000.00 | 213,150,000.00 |
| | අනුරාධපුර | 350 | 52,500,000.00 | 262,500.00 | 525,000.00 | 53,287,500.00 |
| | පොලොන්නරුව | 355 | 53,250,000.00 | 266,250.00 | 532,500.00 | 54,048,750.00 |
| | රත්නපුර | 1645 | 246,750,000.00 | 1,233,750.00 | 2,467,500.00 | 250,451,250.00 |
| | කෑගල්ල | 1070 | 160,500,000.00 | 802,500.00 | 1,605,000.00 | 162,907,500.00 |
| | බදුල්ල | 1900 | 285,000,000.00 | 1,425,000.00 | 2,850,000.00 | 289,275,000.00 |
| | මොනරාගල | 625 | 93,750,000.00 | 468,750.00 | 937,500.00 | 95,156,250.00 |
| | අම්පාර | 550 | 82,500,000.00 | 412,500.00 | 825,000.00 | 83,737,500.00 |
| | මඩකලපුව | 600 | 90,000,000.00 | 450,000.00 | 900,000.00 | 91,350,000.00 |
| | ත්‍රිකුණාමලය | 350 | 52,500,000.00 | 262,500.00 | 525,000.00 | 53,287,500.00 |
| | යාපනය | 870 | 130,500,000.00 | 652,500.00 | 1,305,000.00 | 132,457,500.00 |
| | කිලිනොච්චි | 170 | 25,500,000.00 | 127,500.00 | 255,000.00 | 25,882,500.00 |
| | මුලතිව් | 325 | 48,750,000.00 | 243,750.00 | 487,500.00 | 49,481,250.00 |
| | වව්නියා | 160 | 24,000,000.00 | 120,000.00 | 240,000.00 | 24,360,000.00 |
| | මන්නාරම | 40 | 6,000,000.00 | 30,000.00 | 60,000.00 | 6,090,000.00 |
| | | 16601 | 2,490,150,000.00 | 12450750 | 24901500 | 2,527,502,250.00 |

# ප්‍රජා සවිබලගැන්වීමේ ජාතික වැඩසටහන 2026

Anex 02

## ජීවනෝපාය සංවර්ධන වැඩසටහන

### ක්‍රියාකාරි සැලස්ම

| අංකය | ක්‍රියාකාරකම් | නිම කළ යුතු කාලය | | | | | | | | | | | | වගකීම |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ජන | පෙබ | මාර් | අප්‍රි | මැයි | ජුනි | ජුලි | අගෝ | සැප් | ඔක් | නොව | දෙසැ | |
| 1 | ව්‍යාපාර සංවර්ධන සැලස්ම සකස් කිරීම | | | | | | | | | | | | | දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ මුලස්ථාන හා ව්‍යාපෘති කළමනාකරු |
| 2 | ව්‍යාපාර සැලස්ම අනුමත කිරීම | | | | | | | | | | | | | මුලස්ථාන කළමනාකරු/ප්‍රාදේශීය ලේකම් |
| 3 | තාක්ෂණික පුහුණුව ලබාදීම | | | | | | | | | | | | | දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ මුලස්ථාන හා ව්‍යාපෘති කළමනාකරු |
| 4 | මුල්‍ය ප්‍රදානය ලබාදීම | | | | | | | | | | | | | දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ මුලස්ථාන හා ව්‍යාපෘති කළමනාකරු |
| 5 | ව්‍යාපාර කුසලතා පුහුණුව ලබාදීම | | | | | | | | | | | | | මුලස්ථාන හා ව්‍යාපෘති කළමනාකරු |
| 6 | මුල්‍ය සාක්ෂරතා පුහුණුව ලබාදීම | | | | | | | | | | | | | මුලස්ථාන හා ව්‍යාපෘති කළමනාකරු |
| 7 | ප්‍රගතිය වාර්තා කිරීම | | | | | | | | | | | | | දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ ජීවනෝපාය විෂය කළමනාකරු |

Anex 03

# ප්‍රජා සවිබලගැන්වීමේ ජාතික වැඩසටහන 2026

## ජීවනෝපාය සංවර්ධන වැඩසටහන

### මාසික ප්‍රගති අකෘතිය

| අංකය | ප්‍රා.ලේ කොට්ඨාශය | ක්‍රියාත්මක ව්‍යාපෘති සංඛ්‍යාව | ප්‍රතිලාභින් සංඛ්‍යාව | ව්‍යාපෘතියේ මුළු පිරිවැය රු:- | රජයේ දායකත්වය රු:- | ප්‍රතිලාභි දායකත්වය | ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | හඳුනාගෙන අවසන් | ව්‍යාපාර සැලස්ම සකස් කිරීම | මූල්‍ය ප්‍රදානය ලබාදීම |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |

සකස් කළේ:-
දිස්ත්‍රික් ජීවනෝපාය විෂය කළමනාකරු

අනුමැතිය:-
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ